පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 124

අමාත්‍යාංශයේ නම : තාක්ෂණ අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 124(6) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 124

நிறுவனத்தின பெயர்: தொழில்நுட்ப அமைச்சு

பாராளுமன்றத்தின் வழிவகைகள் பற்றிய குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 124(6) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series Number: 124

Name of the Ministry: Ministry of Technology

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Ways and Means in terms of Standing Order No. 124 (6)

පාර්ලිමේන්තු අනුක්‍රමික අංක: 124

අමාත්‍යාංශයේ නම : තාක්ෂණ අමාත්‍යාංශය

	කමිටුවේ නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
1	මෘදුකාංග වැනි ඩිජිටල් අන්තර්ගත ආනයනය මත බදු කිසිවක් පනවනු නොලබන අතර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ව්‍යාපාරය දිනෙන් දින දියුණු වන ව්‍යාපාරයක් වන බැවින්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට බදු පැනවීම අවශ්‍යය.	මේ වනවිට එවැනි බදු අයකිරීමක් සිදු නොවේ. මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකොට මේ ක්ෂේත්‍රයේ පැවැත්මට බාධාවක් නොවන පරිදි පැනවිය හැකි බදු පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමට නියමිතය. ඒ අනුව ඉදිරියේදී අදාල කර්මාන්ත/සංගම්/සංවිධාන සමගද සාකච්ඡා කර නිසි ක්‍රියාවලියක් සැකසීමට බලාපොරොත්තු වේ.
2	ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය යාවත්කාලීන කළ යුතු අතර අනෙක් රාජ්‍ය ආයතවල තොරතුරු තාක්ෂණ පද්ධති සමග අන්තර් සම්බන්ධ කිරීමේ හැකියාව පැවතිය යුතුය.	ASYCUDA පද්ධතිය යාවත්කාලීන කිරීම ශ්‍රී ලංකා රේගුව මුදල් අමාත්‍යාංශයේ මග පෙන්වීම මත සිදු කළ යුතුය. මෙහිදී අවශ්‍ය තාක්ෂණික සහය තාක්ෂණ අමාත්‍යාංශය විසින් ලබා දිය හැකිය. ASYCUDA පද්ධතිය අනෙක් රාජ්‍ය ආයතන වල තොරතුරු තාක්ෂණ පද්ධති සමග අන්තර් සම්බන්ධ කිරීම සඳහා මෙන්ම සියලුම රාජ්‍ය ආයතන වල පද්ධති එකිනෙක අතර සම්බන්ධ කිරීමට හැකි වන ජාතික තොරතුරු හුවමාරුව (National Data Exchange(NDX)) සැකසීම සඳහා අවශ්‍ය කටයුතු තාක්ෂණ අමාත්‍යාංශය සිදු කරමින් පවති. මෙම ක්‍රියාවලියට මූලාරම්භයක් වශයෙන් රාජ්‍ය ආයතන මේ සඳහා සූදානම් කරණු වස් 2023.09.21 දිනැති වක්‍රලේඛය නිකුත් කරන ලදි.(MOT/2023/02)
3	මූල්‍ය දිරි දීමනා නොමැති වීම, නුසුදුසු ස්ථානමාරු ප්‍රතිපත්තිය සහ ඌන උපයෝජිත පුහුණු අවස්ථා හේතුවෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය (ICT Division) තුළ දැනුම හා විශේෂඥභාවය රඳවා ගැනීම අභියෝගයට ලක්ව ඇත.	රාජ්‍ය අංශය තුල තොරතුරු තාක්ෂණ විශිෂ්ටයන්ගේ කණ්ඩායමක් ඇනිකර ගැනීම සඳහා අවශ්‍ය බදවා ගැනීම් සිදු කල යුතුය. එම ක්ෂේත්‍රයේ තාක්ෂණ විශේෂඥයන් සඳහා කර්මාන්තය තුල ගෙවන වැටුප් හා සමපාත වන පරිදි නිසි වැටුප් ක්‍රම වේදයක් නිබිය යුතුය.මේ සඳහා මුදල් අමාත්‍යාංශය හා ඒකාබද්ධව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
4	ශ්‍රී ලංකා ආර්ථික සහ සංවර්ධනය පිළිබඳ සංවිධානයේ G20 මූලඛාදනය සහ ලාභ මාරු කිරීම පිළිබඳ අන්ත:කරණ රාමුවේ සාමාජිකයකුව සිටියදී "ආර්ථිකය ඩිජිටල්කරණය වෙනිත් පැන නගින බදු අභියෝගවලට විසඳුම් සැපයීම සඳහා වන ද්විත්ව කුළුණු විසඳුම පිළිබඳ ප්‍රකාශය "ට එක්වී නොමැත.	ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා නිසි අධ්‍යනයකින් පසුව අවශ්‍ය පියවර ගැනීමට අදහස් කෙරේ.

5	රේගු බලධාරින්ට දත්ත හුවමාරු කර ගැනීමට සහ වෙළඳාමේ වැරදි ලෙස ඉන්වොයිසි කිරීම හඳුනා ගැනීමට හැකියාව ලබාදෙන බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය හා කෘතිම බුද්ධි තාක්ෂණය (AI Technology) ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා කිරීම. මේ ආකාරයට ශ්‍රී ලංකා රේගුවට ඔවුන්ගේ වෙළඳ හවුල්කාර දෙපාර්තමේන්තු සමග භාණ්ඩ අගය තක්සේරුව ඇතුළු ගනුදෙනු දත්ත තථ්‍ය කාලයට හුවමාරු කිරීමට අවස්ථාව ලැබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මිලෙහි විෂමතා පහසුවෙන් හඳුනාගත හැකි වනු ඇත.	ශ්‍රී ලංකා රේගුව මුදල් අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ අවශ්‍ය පියවර ගත යුතුය. අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට තාක්ෂණ අමාත්‍යාංශයට කටයුතු කළ හැකිය.
6	ඩිජිටල් අන්තර්ගතයන් සහ සේවා සඳහා සංයෝජිත වර්ගීකරණ අංක (HS Codes) හඳුන්වා දීමටත්, ඩිජිටල් සේවාවන් සඳහා නව බද්දක් හඳුන්වා දීමටත් නිර්දේශ කරන අතර එම නව බද්ද හඳුන්වා දීමට පෙර එය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට බලපාන ආකාරය පිළිබඳව සහ අනෙකුත් රටවල හොඳම ක්‍රමවේදයන් පිළිබඳව පුළුල් අධ්‍යනයක් කිරීම යෝග්‍ය වේ.	නව ඩිජිටල් ආර්ථික මූල්‍යොපායන් යටතේ මේ සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියමිතය. එම මූල්‍යොපායන් ලෝක බැංකුවේ සහයෝගය ඇතිව සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.
7	රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය (ppp ආකෘතිය) තුළින් පවත්වාගෙන යනු ලබන පසු මෙහෙයුම් කාර්යාලයක් හරහා ASYCUDA පද්ධතිය කළමනාකරණය කර පවත්වාගෙන යා යුතු බවට නිර්දේශ කරන අතර ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතියට අන්තර් සම්බන්ධ කළ හැකි වන පරිදි එය වැඩිදියුණු කළ යුතුය.ASYCUDA පද්ධතිය තුළ ඒකීය හඳුනාගැනීමේ අංකය පවත්වාගෙන යා යුතු බවට නිර්දේශ කරන අතර ඒකාබද්ධ හඳුනාගැනීමේ අංකය (unique identification number) ලෙස ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාව (SLUDI) යොදා ගැනීමට නිර්දේශ කෙරේ.	ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාව (SLUDI) ව්‍යාපෘතිය ඉන්දිය රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. එය 2025 වසරේදී සම්පූර්ණ කිරීමට නියමිතය. එමගින් ඇතිවන ඒකීය හඳුනාගැනීමේ අංකය මගින් ASYCUDA පද්ධතිය තුළ හඳුනාගැනීමේ අංකය ලෙස භාවිතා කල හැකිය. ඒ සඳහා ඉහතදී සඳහන් කල පරිදි ජාතික දත්ත හුවමාරුව (NDX) ස්ථාපනය කිරීමටද අවශ්‍ය පියවර තාක්ෂණ අමාත්‍යාංශය ආරම්භ කර ඇත.
8	ආනයන අපනයන ක්‍රියාපටිපාටිවලදී මානව මැදිහත් වීම අවම කරනු ලබන බවට වග බලා ගනිමින් ආනයනය කරන ලද සහ අපනයනය කරනු ලබන භාණ්ඩ සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් වරායේදී භාවිතා කරන ස්කෑනින් යන්ත්‍ර කෘතිම බුද්ධි තාක්ෂණය (AI Technology) භාවිතයෙන් නවීකරණය කිරීම සහ පූර්ණ ලෙස ස්වයංක්‍රිය කරණය කිරීමට නිර්දේශ කරන අතර, වරාය සහ ශ්‍රී ලංකා රේගුවේ සහයෝගිතාවයෙන් එක් නිෂ්කාශණ මධ්‍යස්ථානයක් පිහිටුවීම දිරිමත් කිරීමට නිර්දේශ කෙරේ	ශ්‍රී ලංකාවේ AI තාක්ෂණය භාවිතය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා AI Taskforce, ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ස්ථාපනය කර ඇත. තාක්ෂණ අමාත්‍යාංශයද එහි පාර්ශව කරුවෙකු වන අතර ඉදිරියේදී එම කමිටුව මගින් මාර්ගෝපදේශකයන් නිකුත් කිරීමට පියවර ගනිමින් පවතී. ඒ යටතේ මෙම අමාත්‍යාංශය සඳහා ද අවශ්‍ය යෝජනා නිකුත් කිරීමට පියවර ගනු ඇත. අවශ්‍ය පියවර මුදල් අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා රේගුව විසින් සිදු කල යුතුය.
9	"ආර්ථිකයේ ඩිජිටල්කරණයෙන් පැන නගින බදු අභියෝග විසඳීම සඳහා කුළුණු දෙකේ විසඳුම පිළිබඳ ප්‍රකාශය "සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධ විය යුතු යැයි නිර්දේශ කෙරේ.	ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා නිසි අධ්‍යනයකින් පසුව අවශ්‍ය පියවර ගැනීමට අදහස් කෙරේ.

10	ASYCUDA පද්ධතිය කාර්යක්ෂමව කළමනාකරණය කර පවත්වා ගෙන යාමට ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය (ICT Division) වැඩිදියුණු කිරීමට නිර්දේශ කෙරේ.	මුදල් අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා රේගුවේ ද ඉල්ලීම මත තාක්ෂණ අමාත්‍යාංශයේ සහය මේ සඳහා ලබා දීමට කටයුතු කල හැකිය.
11	ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාව (SLUDI) ක්‍රියාත්මක වීමෙන් පසු ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතාව (SLUDI) යොදා ගැනීමට නිර්දේශ කෙරේ.	SLUDI ව්‍යාපෘතිය 2025 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු ඉන්දිය රජයේ ආධාර මත මේ වනවිට සිදුකරමින් පවතී. RAMIS හි හඳුනා ගැනීමේ අංකය ලෙස SLUDI යොදා ගත හැකිය.
12	ඒකීය ඩිජිටල් අනන්‍යතාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන තුරු මෙම සියලු ආයතන විසින් ජාතික හැඳුනුම්පත් අංකය ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස භාවිත කිරීමට නිර්දේශ කෙරේ.	දැනට භාවිතා වේ.
13	රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන විට, අනෙකුත් රාජ්‍ය ආයතනවල තොරතුරු තාක්ෂණ පද්ධති සමග ඒකාබද්ධ කිරීමට හැකිවන ප්‍රතිපාදන සහිතව තොරතුරු තාක්ෂණ පද්ධතියේ තාක්ෂණික හැකියාව සහතික කිරීමට ජනාධිපති ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට නිර්දේශ කෙරේ.	මේ වන විට එම චක්‍රලේඛය නිකුත් කර ඇත.(2023.09.21) (MOT/2023/02). තාක්ෂණ අමාත්‍යාංශය අවශ්‍ය නිර්දේශ ලබා දෙනු ඇත.
14	අවම වශයෙන් දැනට රාජ්‍ය ආයතනවල පවතින තොරතුරු තාක්ෂණ පද්ධති නවීකරණය හෝ යාවත්කාලීන කර 2024 වර්ෂයේ මුල් කාර්තුව තුළ 2016 වර්ෂයේ සිට යෝජනා වී ඇති ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ.	ITMIS මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින අතර මුදල් අමාත්‍යාංශය මෙය වැඩිදියුණු කිරීමට හා අනෙකුත් ප්‍රධාන ආයතන මේ සමග ඒකාබද්ධ කිරීමට කටයුතු කරනු ලබයි. අවශ්‍ය තාක්ෂණ සහය තාක්ෂණ අමාත්‍යාංශය ලබාදේ.

